**ශීර්ෂය 018 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 018 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(5) ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්කම් පරීක්ෂණයට භාජනය වන බවට වග බලා ගැනීමට විධිවිධාන යෙදිය යුතු වුවත් ,18-1-1-0- 1301 වැය විෂයයේ රු.4,000,000 ක් වූ මූලික වියදම් ඇස්තමේන්තුව සඳහා වර්ෂය තුල දී මු.රෙ.66 මගින් රු.210,000 ක අමතර ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රතිපාදන ඉතිරිය රු. 338,916 ක් වී තිබුණි. | 1301 වැය විෂයට අදාළ වාහන නඩත්තුව සම්බන්ධ බිල්පත් 2023 වසරේ ජනවාරි මාසය තුළ ඉදිරිපත්වීම නිසා එම වැය විෂයයේ 2022 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි විය. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) යටතේ දක්වා ඇති රු.828,745 ක බැරකම් භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු බැඳීම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි. එසේවුවද, එම බැරකම් 2023 වර්ෂය තුළ දී නිරවුල් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛවලට අනුව Cigas පද්ධතිය හරහා නියමිත දිනවලදී බැරකම් දත්ත ඇතුළත් කරන ලදි . බැරකම්වලට අදාල ගෙවීම් ඉතිරි ප්‍රතිපාදනවලට යටත්ව සිදු කර ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත සමඟ කාර්යාලීය පොත් සැසඳී තිබිය යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 137 | 427,712 | වවුචර්පත් 09 ක් සඳහා අනුමත කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. | අතපසුවීමක් නිසා අනුමත කිරීමකින් තොරව ගෙවීම් කර ඇති අතර එය නිවැරදි කරන ලදි. ඉදිරියේදී මෙවන් අතපසුවීම් සිදු නොවීමට නිලධාරීන් දැනුවත් කරන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුමත කළ වවුචර්පත් සඳහා ගෙවීම් කළ යුතු වේ. |
| (ii) | මුදල් රෙගුලාසි 138(8 ) | 42,650 | වවුචර්පත් 06 ක් සඳහා වියදම සහතික කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. | අතපසුවීමක් නිසා ගෙවීම් වවුචර්වල වියදම සහතික කිරීම සිදු කර නොමැති අතර , එය නිවැරදි කිරීමට කටයුතු කරන ලදි. ඉදිරියේදී මෙවන් අතපසුවීම් සිදු නොවීමට නිලධාරීන් දැනුවත් කරන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සහතික කළ වවුචර්පත් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 225 (4) | 127,793 | වවුචර්පත් 07 ක පිළියෙල කරන හෝ ඒවායේ හරි වැරදි බලන නිලධාරීන් විසින් කෙටි අත්සන සඳහා ඉඩ තබා ඇති ස්ථානයන්හි සිය කෙටි අත්සන් යොදා නොතිබුණි. | ඉදිරියේදී වවුචර්පත් පරීක්ෂා කළ බවට අත්සන් යොදා ගෙවීම් කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචර් පිළියෙල කරන හෝ ඒවායේ හරි වැරදි බලන නිලධාරීන් විසින් තම කෙටි අත්සන අදාල ස්ථානයේ යොදා ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතු වේ. |
| (iv) | මුදල් රෙගුලාසි 232 (2) හා 245(1) | 60,068 | වවුචර් 03 ක ගෙවීම් කරන ලද මුදල අකුරෙන් සඳහන් කර නොතිබුණි. | අතපසුවීමක් නිසා සිදුවී ඇත. අදාළ නිලධාරින් මේ සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කරන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචරයේ ගෙවීම් කරන ලද මුදල අකුරෙන් සඳහන් කළ යුතු වේ. |
| (v) | මුදල් රෙගුලාසි 267(1) | 37,083,232 | සේවකයෙකුගේ වැටුප/වේතනය ආදායකයාටම ගෙවා එය භාරගත් බවට ආදායකයාගේ අත්සන නොමැතිව වැටුප් ගෙවා තිබූ අවස්ථා 14ක් විය. | මේ සම්බන්ධව අදාල කාර්ය මණ්ඩලය දැනුවත් කල අතර ඉදිරියේ දී වැටුප් ලැයිස්තුවල අත්සන් නොලබන නිලධාරීන්ගේ වැටුප ලබා දීම අත්හිටුවන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායකයාගේ අත්සන අදාල පඩි සටහන් පත්‍රයෙහි හෝ පඩි ලැයිස්තුවෙහි තබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (vi) මුදල් රෙගුලාසි 453(2) (එ) | 89,201,190 | පුද්ගල පඩිනඩි ලැයිස්තුවෙහි සටහන් සම්පූර්ණ ලෙස සඳහන් කර , මුලු ගණන් බලා, සංසන්දනය කර තිබෙන බවට සහතික කිරීමකින් තොරව වවුචර්පත් 27 ක් සඳහා වැටුප් ගෙවීම් කර තිබුණි. | සියලුම වවුචර්පත් අදාල නිලධාරින් විසින් ITMIS පද්ධතිය හරහා නිර්දේශ, අනුමැතිය හා සහතික කිරීම සිදුකරන අතර මෙය අතපසුවීමකින් සිදුව ඇත. ඉදිරියේදී එය නිවැරදි කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම පඩි ලැයිස්තුවක්ම සහතික කරන නිලධාරියා විසින් සහතික කළ යුතු වේ. |
| (ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | | |
| (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ IV ඡේදය | 197,273 | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව වේලාව පදනම් කර ගනිමින් ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කර ගත යුතු වුවද, එක් නිලධාරියෙකු සඳහා අප්‍රේල් | ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස රාජකාරී කටයුතු මෙම කාර්යාලයේ සිට මෙන්ම නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ හා ගම්පහ පිහිටි කාර්යාලයේ සිට සිදු කරනු ලබන බැවින් මෙම කාර්යාලයේ පැමිණීම හා පිටවීම සටහන් කර නොමැත. කෙසේ වුවද මේ වනවිට | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ගෙවා තිබූ දීමනා සඳහා කාලය, ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කර ගෙන නොතිබුණි. | ඇයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සටහන් කරන ලෙස උපදෙස් ලබා දුන් අතර 2022 දෙසැම්බර් මස සිට ඇයහට පාර්ලිමේන්තු දීමනා හා රාජකාරී දීමනා නොගෙවයි. | |

(ii)

| | | | | |
|---|---|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර තිබූ, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශ යේ 6.2 ඡේදය | - | වාර්තාකරණ ආයතනයට අදාල වන වැය විෂයයන් පමණක් ආකෘති පත්‍රවල ඇතුලත් කර නොතිබුණු අතර තම ආයතනයට අදාල නොවන ආකෘති පත්‍රද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන අදාල චක්‍රලේඛයට අනුව පිළියෙල කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කළ යුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 13 හි දැක්වෙන ආකෘති ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී අදාල ආකෘතිය පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට නිලධාරින්ට උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.2 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 4. යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | මෙම කාර්යාලය ‘බී’ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන අතර, ඉතා සීමිත කාර්ය මණ්ඩලයක් හා වැය ශීර්ෂය යටතේ ඉතාමත් අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් පෙන්වන බැවින්, අභ්‍යන්තර විගණන කමිටු පිහිටුවීම අනවශ්‍ය බව පෙන්වා දී ඇති අතර, කාර්යාලයේ මූල්‍ය පාලනය නිසි පරිදි පවත්වා ගෙන යාම සඳහා ගණකාධිකාරී තනතුරක් ඇති කර ඇත. | පනතේ දැක්වෙන විධිවිධානයන්ට අනුකූල විය යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 මානව සම්පත් සංවර්ධන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.3 ඡේදය ප්‍රකාරව එක් එක් නිලධාරී තලය අනුව හඳුනාගත් නිපුනතා ඉලක්ක සපුරා ගැනීම පිණිස සකස් කළ යුතු ධාරිතා සංවර්ධන වැඩසටහන් සකස් කර නොතිබුණි. තවද, චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 05/2022 හා 2022.09.02 දිනැති චක්‍රලේඛය ප්‍රකාර පුහුණු වැඩසටහන් සඳහා මුදල් වෙන් නොකරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව ධාරිතා සංවර්ධන වැඩසටහනක් සකස් නොකරන ලද අතර, ඉතාමත් අත්‍යවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |